# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/21 - 2015 ජූනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක. 54.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ නිෂ්පාදකයින් හා වෙළෙඳුන් විසින් සිය ආයතනය/වෙළෙඳසැල බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු බවටත් එසේ ලියාපදිංචි කළ බවට නිකුත් කරන ලද සහතිකය සිය ආයතනයෙහි / වෙළෙඳසැලෙහි ප්‍රකටව පෙනෙන කොටසක හෝ / ස්ථානයක ප්‍රදර්ශනය කිරීම අනිවාර්‍ය්‍ය බවටත් මෙයින් විධානය කරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

i. අටපිරිකර
ii. තනිපට සිවුර, දෙපට සිවුර සහ අඳනකඩය
iii. පාත්‍රය
iv. බඳ පටිය

මෙම විධානය වර්ෂ 2015 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 761

1A - PG 2505 — 206 (2015/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.